# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආයිෂා අධ්‍යාපන භාරය
## (සංස්ථාගත කිරීමේ)

**ආයිෂා අධ්‍යාපන භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2017 දෙසැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 නොවැම්බර් මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[225 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 18.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010534—260 (2017/12)

## ආයිෂා අධ්‍යාපන භාරය
## (සංස්ථාගත කිරීමේ)

### ආයිෂා අධ්‍යාපන භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''ආයිෂා අධ්‍යාපන භාරය'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී ආයතනයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක  දරන ආයිෂා අධ්‍යාපන භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අයිෂා අධ්‍යාපන භාරය සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ආයිෂා අධ්‍යාපන භාරයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ආයිෂා අධ්‍යාපන භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මාතෘත්ව සංවර්ධනය අරමුණු කරගත් සමාජ විද්‍යාව, ඉස්ලාම් අධ්‍යාපනය පිළිබඳව තෘතියික මට්ටමේ අධ්‍යාපනය සැපයීම;

2—PL 010379 -300 (2017/10)

(ආ) කාන්තාවන් සවිබල ගැන්වීම සහ පවුල් සංවර්ධනය පිළිබඳ කෙටිකාලීන පාඨමාලා සැපයීම;

(ඇ) ගැහැණු දරුවන්ගේ කුසලතා හා නායකත්ව ගුණාංග සංවර්ධනය කිරීම;

(ඈ) දැනුම හා කලාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සම්මන්ත්‍රණ, සමුළු, වැඩමුළු, සාකච්ඡා, විවාද, චිත්‍ර ප්‍රදර්ශන ආදී වූ ක්‍රියාකාරකම් පැවැත්වීම;

(ඉ) පුවත්පත්, සඟරා එක්රැස් කිරීම, වර්ග කිරීම, මුද්‍රණය කිරීම, පළකිරීම හා බෙදාහැරීම;

(ඊ) ජනතාව අතර ප්‍රජාමූල, ජාතික හා ජාත්‍යන්තර අවබෝධය, ආගමික සහජීවනය, යහපැවැත්ම හා සාමය ඇතිකිරීමේ අරමුණින් දිරිගැන්වීමේ, සහායවීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(උ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ මධ්‍යස්ථානයේ පුහුණුවීම් සිදුකිරීම;

(ඌ) ප්‍රදේශයේ ඇති අමුද්‍රව්‍ය භාවිතා කරමින් කාන්තාවන් සඳහා කාර්මික හෝ වෙළෙඳ ක්ෂේත්‍රයේ වෘත්තිය පාඨමාලා ඇතිකිරීම; සහ

(ඔ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට ලිඛිත නීතියකට පටහැනි නොවන පරිදි අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**4.** (1) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයන් ඉදිකිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුලුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කලට යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී, එවැනි ම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු, භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළ වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින් ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

**9.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

**සංගමය සංස්ථාව සතුවීම.**

**11.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට—

(අ) සංගමයට අයත්ව තිබූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද;

(ආ) සංගමයේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ සංගමයේ සියලු බැරකම් ද; සහ

(ඇ) සංගමයේ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද,

සම්පූර්ණයෙන් සංස්ථාව සතු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි-

(අ) සංගමයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) සංගමයේ සියලු බැරකම්, සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) සංගමයේ සියලු නිලධරයන් සහ සේවකයන්, සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) පැවති සංගමයේ කාර්ය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඉ) විනිශ්චයට භාජනයව පැවතියා වූ සංගමය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇත්තා වූ ද සියලු නඩු හා නඩු කටයුතු, සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හා නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.*

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙද දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ ලබා දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**14.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම.*

**15.** මේ පනතින් හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙ හි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.